**ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා පෞද්ගලික සමාගම - 2019**

----------------------------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා පෞද්ගලික සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.90,420,529 ක් වුවත් එදිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් සමාගමට ගෙවිය යුතු ශේෂය රු.42,758,471 ක් විය. ඒ අනුව අදාළ ශේෂයන් අතර වූ රු.47,662,058 ක වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | අප විසින් ඉන්වොයිසිපත් යොමු කරන්නේ අදාල සේවය ලබා ගන්නා අංශය වෙතයි. ඒවා ගෙවීම් සඳහා අධිකාරියේ මූල්‍ය අංශය වෙත යොමු කරනු ඇත්තේ එම අංශය වන බැවින් එම පොරොත්තු කාලය පසු කරමින් පැවැති ඉන්වොයිසිපත් අධිකාරිය විසින් වාර්තා නොකලේද යන්න පිළිබඳව අප දැනුවත් නැත. | අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය පිළිබඳව කාලීනව ශේෂ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර අවශ්‍ය ගැලපුම් සිදුකිරීමට කටයුතු කලයුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගෙවීම් වවුචර්පත් | රු. 8,865,577 | 2016 ජූලි 1 දින සිට 2018 අප්‍රේල් 30 දින දක්වා සමාගමේ සිදු වූ මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් විගණන පරීක්‍ෂණයේදී අනාවරණය කරගත් රු. 8,865,577 ක ගෙවීම් 49 කට අදාළ ගෙවීම් වවුචර්පත් හා උපකාරක ලියවිලි 2020 මැයි 31 දින වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | මේ සම්බන්ධව අප විසින් නිසි සොයා බැලීමක් සිදු කර ඇත. එහිදි අනාවරණය වූ කරුණු අනුව මෙහි දක්වා ඇති කරුණු මත වංචාවක් සිදු වීමේ ඉඩකඩක් නොමැති බව අපගේ නිගමනයයි. | ගෙවීම් වලට අදාළ ගෙවීම් වවුචර්පත් හා උපකාරක ලියවිලි විගණනයට ලබාදීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 2 හි 36 වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම අනුව පිළියෙල කළ යුතු වුවත් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගාලු මුවදොර පරිශ්‍රයේ වෙළඳ කුටි ඇතුලු වෙළඳුන්ගෙන් ලැබිය යුතු කුලී ආදායම්, මුදල් පදනමට ගිණුම්ගතකිරීම හේතුවෙන් වර්ෂය සඳහා ලැබිය යුතු ආදායම් රු 5,301,077ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ගාලු මුවදොර පරිශ්‍රය ගිවිසුමක් හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අප වෙත එහි පරිපාලනය සඳහා ලබා දී ඇත.වෙළෙඳ කුටි ඇතුළුව අනෙකුත් සුළු පරිමාණ දෛනික ජංගම ව්‍යාපාරිකයන් රැසක් මෙහි වෙළෙඳ කටයුතු සිදු කරනු ලැබේ. එම ව්‍යාපාරිකයන් ගාලු මුවදොර එම වෙළෙඳ කුටි වල ඉතාමත් දිගු කාලයක සිට (අවුරුදු 30-50 පමණ) පාරම්පරික ව්‍යාපාර කටයුතු සිදු කරන අයයි.අප විසින් පරිශ්‍රයේ පරිපාලනය වරාය අධිකාරියෙන් ලබා ගන්නා විටත් එම ව්‍යාපාරිකයන් සහ වෙළෙඳ කුටි එතැන තිබුනි.එබැවින් එම ව්‍යාපාරිකයන් සමඟ ගිවිසුම්ගත වීම ප්‍රායෝගිකව ඉතාමත් අපහසුය. | උපචිත පදනමට ආදායම් හඳුනා ගැනීමට සහ වෙළඳුන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළයුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛය | | | |
| | (i) 5.1.1 වගන්තිය | සමාගමේ දිගුකාලීන අරමුණු දැක්වෙන සංයුක්ත සැලැස්මක් 2020 මැයි 28 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. | පිළියෙල කරමින් පවතී. | දිගුකාලීන ඉලක්ක දැක්වෙ සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළයුතුය. |
| | (ii) 7.4.1 වගන්තිය | සමාගමේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සඳහා සුදුසු විගණන ආයතනයක්, හෝ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානය යොමු වී ඇත.ඒ අනුව ඉදිරියේදී මෙම විධි විධාන හා අනුගත වීමට කටයුතු කරනු ලැබේ. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| | (iii) 7.4.5 වගන්තිය | ආයතනය සතු පිරිවැය රු.7,760,496 ක් වූ ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| | (iv) 9.2 වගන්තිය | සමාගමේ සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර | සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | | |
| | (v) 9.3.1 වගන්තිය | සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | අනුගත වීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7 (1),8 (2) හා 23 වන වගන්ති | මෙම වගන්තිවල අවශ්‍යතාවයන් පරිදි පිළිවෙලින් තොරතුරු වාර්තා නියමිත ආකෘතියක් යටතේ සංරක්ෂණය කර පවත්වාගෙන යාම, ආයතනය පිළිබඳ විස්තර වාර්තාවක් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත්කිරීම හා තොරතුරු නිලධාරියකු පත්කිරීම යන අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ නිර්වචනය කර ඇති පොදු අධිකාරී යටතට 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත අප සමාගම යටත් විය යුතුද යන්න පිළිබඳව නෛතික උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව අදාල අවශ්‍යතාවලට අනුකූල වීමට කටයුතු කරනු ලැබේ. | තොරතුරු දැන ගැනීමේ පනතේ අවශ්‍යතා ප්‍රකාරව කටයුතු කිරීමට කළමනාකරණය කටයුතු කළයුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක පීඊඩී 1/2015(i) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා චක්‍රලේඛ සීමාවන්ට පටහැනිව ප්‍රවාහන දීමනා ලෙස රු.469,555 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂක වෙත ගෙවන ලද මෙම දීමනා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව සිදු කර ඇත.කෙසේ වුවත් 2020 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂක වෙත ගෙවනු ලබන සියළුම දීමනා චක්‍රලේඛ හා අනුගත කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය | තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. | තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක ලගා කර ගත හැකි වන ආකාරයට ඒවා මැන බැලීම සඳහා දර්ශකයන් හඳුවාදීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,578,695 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.10,762,687 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,183,992 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට සෘජු වියදම් වැඩිවීම සහ වෙනත් ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාලු මුවදොර පිටිය පරිපාලනය, නඩත්තු කිරීම හා කළමනාකරණය කිරීමට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ සමාගම විසින් අත්සන් කරන ලද ගිවිසුමෙහි වලංගු කාලය 2019 පෙබරවාරි 09 දිනෙන් අවසන් වී තිබූ නමුත් එම ගිවිසුම අලුත් කිරීම 2020 මැයි 31 දින වන විටත් සිදු කර නොතිබුණි. | අප විසින් මේ වන විට කිහිප වතාවත් මේ සම්බන්ධව අධිකාරිය වෙත දැනුම් දී ඇතත් තවමත් ගිවිසුම සම්බන්ධව නිසි අවධානයක් ලැබී නොමැත. කෙසේ වෙතත් මෙම ස්ථානය කොළඹ නගරයේ මහජනතාව ගැවසෙන ප්‍රධානම බිම්කඩ වන බැවින් වරාය අධිකාරියේ සම්බන්ධිත සමාගමක් වන අප හට මෙහි නඩත්තු කටයුතු වලින් ඒකපාර්ශවියව ඉවත් වීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇත. | අදාල පාර්ශවය සමග සාකච්ඡා කර අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පාරිතෝෂික ගෙවීමේ පනතේ සහ සේවක භාරකාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාසික වාරික නියමිත දිනට නොගෙවීම හේතුවෙන් අධිභාර ලෙස රු.332,174 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. | එකඟ වේ. | අදාල ගෙවීම් නියමිත දිනට සිදු කිරීමටත්, අධිභාර ගෙවීම් ඉදිරියේදී සිදු නොවීමටත් කළමනාකරණය කටයුතු කළයුතුය. |
| (ඇ) | සමාගම විසින් 2018 වර්ෂය තුලදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත සපයන ලද මානව සම්පත් සඳහා වැටුප් වශයෙන් රු. 4,120,808 ක් ලැබිය යුතු වූ නමුත් අදාල සේවක පැමිණීම් හා පිටවීම් වාර්තාවල පැවති අක්‍රමිකතා, වැටුප් ගණනය කිරීමේ වැරදි, පත්වීම් ලිපිවල අඩුපාඩු යනාදී හේතු මත සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් අයකරගත නොහැකිව පැවතුණි. | මෙම වැටුප් ගෙවනු ලබන්නේ අප හරහා වරාය අධිකාරියේ සේවයේ නියුක්ත කරන ලද සේවකයන් වෙතය.එම සේවකයන්ගේ පැමිණීමේ වාර්තා, අතිකාල ගණනය කිරීම් ආදිය අප වෙත යොමු කරන්නේ අධිකාරියේ එම සේවකයන් සේවය කරන අංශයේ ප්‍රධානියා හරහා වේ.<br><br>එබැවින් මෙම මුදල අය කර ගැනීම සඳහා එම සියළු අංශ සමග එකින් එක සාකච්ඡා කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | සමාගම වෙත ලැබිය යුතු මුදල් නොපමාව අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ගාලු මුවදොර පරිශ්‍රයේ වෙළඳ කටයුතුවල නිරත වෙළඳුන්ගෙන් ආදායම් ලබාගැනීම විධිමත් කර ගැනීමේ අවශ්‍යතාවය පිලිබඳව 2017 වර්ෂයේ සිට විගණන වාර්තා මගින් සමාගම දැනුවත් කලද 2020 මැයි 31 දින දක්වාම වෙළඳුන් සමඟ ගිවිසුම්වලට එළඹීම වැනි විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | අප විසින් පරිශ්‍රයේ පරිපාලනය වරාය අධිකාරියෙන් ලබා ගන්නා විටත් එම ව්‍යාපාරිකයන් සහ වෙළෙඳ කුටි එතැන තිබුනි.එබැවින් එම ව්‍යාපාරිකයන් සමඟ ගිවිසුම්ගත වීම ප්‍රායෝගිකව ඉතාමත් අපහසුය. | පරිශ්‍රයේ වෙළඳ කටයුතුවල නිරත වෙළඳුන් සමඟ විධිමත් ආකාරයේ ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළයුතුය. |